ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රවෘත්ති සංස්කාරක 2024 නොවැම්බර් 21

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2024 ඔක්තෝබර්

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

දුරකථනය: **011-2147414** ෆැක්ස්: **011-2877945** ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2024 ඔක්තෝබර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) -0.7%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2024 සැප්තැම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය -0.2ක් ලෙස වාර්තා විය. 2024 ඔක්තෝබර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 0.6%ක හා ආහාර නොවන කාණ්ඩයේ -1.3%ක දායකත්වයක් පිළිවෙළින් ලබා දී ඇත. ආහාර කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2024 සැප්තැම්බර් මාසයේදී 0.5% සිට 2024 ඔක්තෝබර් මාසයේ 1.3% දක්වා වැඩි වී ඇති අතර, ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2024 සැප්තැම්බර් මාසයේදී -0.7% සිට 2024 ඔක්තෝබර් මාසයේදී -2.3% දක්වා අඩු වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පදනම:2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කළ විට, 2024 සැප්තැම්බර් මාසයේ 203.1 ක් වූ දර්ශකාංකය, 2024 ඔක්තෝබර් මාසයේ දී 202.1 ක් දක්වා අඩු වී ඇති බව වාර්තා විය. මෙමගින් 2024 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව 2024 ඔක්තෝබර් මාසයේ දර්ශකාංකය 1.0ක අඩුවීමක් එනම් 0.50ක ප්‍රතිශතාංක අඩුවීමක් පෙන්නුම් කරයි. මෙම මාසික වෙනස්වීම සඳහා ආහාර කාණ්ඩය 0.16% කින් අඩුවීම සහ ආහාර නොවන කාණ්ඩය 0.35% කින් අඩුවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැලකූ විට මිලෙහි අඩුවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත්තේ එළවළු, අලුත් මාළු, අලුත් පලතුරු, බිත්තර, අර්තාපල්, මුං ඇට, ඉඟුරු, සීනි, ළදරු කිරිපිටි, පාන් (සාමාන්‍ය සහ තිරිඟුපිටි යන ආහාර ද්‍රව්‍යවල වේ. එහෙත්, පොල්, පොල් තෙල්, සහල්, දෙහි, කහ කුඩු, අමු මිරිස්, තේ කුඩු/කොළ, ටින්මාළු සහ මයිසූර් පරිප්පු යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කළ විට, 2024 ඔක්තෝබර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය අඩුවීම සඳහා ‘ප්‍රවාහන’(*පෙට්‍රල්*), ‘නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන'(ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය), 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' , ‘ආපනශාලා සහ හෝටල්’ සහ ‘විනෝදාත්මක සහ සංස්කෘතික’ යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එහෙත්, ‘සෞඛ්‍ය (ඖෂධ නිෂ්පාදන මිලදී ගැනීම), ‘විවිධ භාණ්ඩ සහ සේවා’ සහ ‘රෙදිපිළි සහ පාවහන්’ යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත. තවද, ‘මද්‍යසාර පාන වර්ග, දුම්කොළ සහ මත්ද්‍රව්‍ය’ යන කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. තවදුරටත් සලකා බැලීමේදී, සන්නිවේදන’ සහ ‘අධ්‍යාපන’ යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල ඔක්තෝබර් මාසය පුරා නොවෙනස්ව පැවති බවත් වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පදනම: 2021=100) ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2024 සැප්තැම්බර් මාසයේ 1.9% සිට 2024 ඔක්තෝබර් මාසයේදී 1.7% දක්වා අඩුවීමක් වාර්තා විය.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| 2023 | ඔක්. | 203.6 | 224.1 | 190.4 | 189.2 | 0.0 | 0.1 | 1.0 | -5.2 | 6.3 | 0.6 |
| | නොවැ. | 206.0 | 228.1 | 191.8 | 189.3 | 1.2 | 0.1 | 2.8 | -2.2 | 7.1 | 0.8 |
| | දෙසැ. | 208.8 | 236.2 | 191.2 | 189.7 | 1.4 | 0.2 | 4.2 | 1.6 | 6.3 | 0.9 |
| 2024 | ජන. | 215.0 | 242.4 | 197.3 | 193.9 | 3.0 | 2.2 | 6.5 | 4.1 | 8.5 | 2.2 |
| | පෙබ. | 214.5 | 239.5 | 198.3 | 194.6 | -0.2 | 0.4 | 5.1 | 5.0 | 5.1 | 2.7 |
| | මාර්තු | 210.0 | 234.4 | 194.3 | 194.5 | -2.1 | -0.1 | 2.5 | 5.0 | 0.7 | 3.4 |
| | අප්‍රේල් | 208.2 | 231.1 | 193.4 | 193.9 | -0.9 | -0.3 | 2.7 | 3.3 | 2.3 | 3.0 |
| | මැයි | 206.3 | 227.3 | 192.8 | 193.6 | -0.9 | -0.2 | 1.6 | 0.5 | 2.4 | 3.1 |
| | ජූනි | 208.1 | 232.8 | 192.1 | 193.7 | 0.9 | 0.1 | 2.4 | 1.9 | 2.7 | 3.9 |
| | ජූලි | 206.9 | 234.0 | 189.4 | 193.7 | -0.6 | 0.0 | 2.5 | 2.9 | 2.2 | 3.0 |
| | අගෝ. | 204.1 | 229.7 | 187.6 | 193.0 | -1.4 | -0.4 | 1.1 | 2.3 | 0.2 | 2.3 |
| | සැප්. | 203.1 | 227.9 | 187.1 | 192.5 | -0.5 | -0.3 | -0.2 | 0.5 | -0.7 | 1.9 |
| | ඔක්. | 202.1 | 227.1 | 186.0 | 192.4 | -0.5 | -0.1 | -0.7 | 1.3 | -2.3 | 1.7 |